# සාමාන්‍ය සමයේ තිස් එක් වන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය මලාකි 1: 13බී – 2: 2, 8–10

*මලාකි දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.*

### තුඹලා නිවැරදි මාර්ගයෙන් බැහැර ගොස් ඇත.

"සොරා ගත්තා වූ නොහොත් කොර වූ හෝ ලෙඩ වූ හෝ සතුන් පූජාවන් වශයෙන් තුඹලා ගෙනෙන්නහු ය. තුඹලාගේ අතින් මා ඒවා පිළිගන්නවා ඇතැ යි තුඹලා සිතන්නහු ද? මා හට පූජා කරන්න පොරොන්දු වූ හොඳ සතුන් රැළේ සිටිය දී, වැදැගැම්මක් නැති සතෙකු මට පූජා කරන ප්‍රයෝගකාරයාට වන විපතක මහත! මන්ද, මම ශ්‍රේෂ්ඨ රජෙක්මි. සියලු රටවල සෙනඟ මාගේ නාමයට ගරුබිය දක්වති" යි සියලු බලැති සමිඳාණන් වහන්සේ වදාරන සේක. "තුඹලාගේ ක්‍රියාවලින් මට ගෞරව නොකරන්නහු නම්, මා වදාරන දේට තුඹලා සවන් නොදෙන්නහු නම්, එය හොඳින් සිතට නොගන්නහු නම්, තුඹලා පිට මම ශාපයක් පමුණුවන්නෙමි. තුඹලා ලබන ආශිර්වාදය ශාපයට හරවමි. ඇත්ත වශයෙන් තුඹලා මාගේ ආඥා තදින් සිතට නොගත් නිසා දැනටමත් මා ඒවාට ශාප කර ඇත.

"එහෙත්, පූජකයන් වන තුඹලා හරි මාර්ගයෙන් පිට ගොස් ඇත. තුඹලාගේ ඉගැන්වීම් නිසා බොහෝ දෙනකු වරදට වැටී ඇත. ලෙවී සමඟ මා කළ ගිවිසුම තුඹලා කඩ කර ඇත. තුඹලා මාගේ ඉගැන්වීම් නොපිළිපැද, මාගේ කැමැත්ත ගැන උගන්වන විට සියලු දෙනා එක සේ නොසලකන බැවින් මම ද ඉශ්රායෙල් සෙනඟ විසින් තුඹලා හෙළාදකිනු ලබන්න සළස්වන්නෙමි." මෙසේ පවසන්නේ සියළු බලැති සමිඳාණන් වහන්සේ ය.

අප සියල්ලන්ට ඇත්තේ එක ම පියාණන් වහන්සේ නොවේ ද? අප මැව්වේ එක ම දෙවියන් වහන්සේ නොවේ ද? එසේ නම්, එකිනෙකාට ද්‍රෝහිකම් කරමින්, අපේ මුතුන්මිත්තන් සමඟ දෙවියන් වහන්සේ කළ ගිවිසුම අප කෙලෙසන්නේ මන් ද?

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය　　ගීතාවලිය 131: 1-3

**පිළිතුර:** සමිඳුනි, ඔබ වහන්සේ තුළ මම සාමය අත්දකින්නෙමි.

**ගීය :** සමිඳුනි, මාගේ සිත තුළ අහංකාරයක් නැත.
උදාරම් ලෙස මම ඇස් නොඔසවමි.
වඩා උසස් දේ ගැන වත්, මාගේ තරම
ඉක්මවා යන දේ ගැන වත් මම කරදර නොවෙමි.

ඒ වෙනුවට මම ලද දෙයින් නිහතමානී ව සැනසී සිටිමි.
මවු තුරුල්ලේ සංසුන් ව සිටින ළදරුවකු සේ
මා තුළ මාගේ සිත සංසුන් වී ඇත.

එම්බා ඉශ්රායෙල්වරුනි! මෙතැන් පටන් සදහට ම
සමිඳුන් කෙරෙහි බලාපොරොත්තු වන්න.

## දෙවන දේව ප්‍රකාශනය　　1 තෙසලෝනික 2: 7-9, 13

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

සුබ අස්න පමණක් නොව අපගේ ම ජීවිත පවා
ඔබට දීමට සතුටු ව සිටියෙමු.

ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේරිතයන් මෙන් එසේ සෙවීමට අපට අයිතියක් තිබුණ නමුත් අපි එසේ නොකෙළෙමු. කිරි මවක් සිය දරුවන් මෘදු ලෙස පෝෂණය කරන්නාක් මෙන් අපි ඔබ අතරෙහි මෘදු ලෙස සිටියෙමු. ඔබ අපට කෙතරම් ප්‍රේමාන්විත වූවහු ද යත්, දෙවියන් වහන්සේගේ සුබ අස්න දීමට පමණක් නොව, අපගේ ම ජීවිත පවා ඔබට දීමට සතුටු ව සිටියෙමු. ඔබ අපට එතරම් ප්‍රිය මනාප වූවහු ය. මන්ද, සහෝදරවරුනි, අපි කෙතරම් වීර්යයෙන් හා වෙහෙස මහන්සියෙන් සේවය කළෙමු දැ යි ඔබට මතක ඇත.

අපි ඔබෙන් කිසිවෙකුට බරක් නොවන පිණිස දිවා රෑ දෙක්හි රැකියාවක යෙදෙමින් දෙවියන් වහන්සේගේ සුබ අස්න ඔබට දේශනා කළෙමු.

තවත් කරුණක් ගැන අපි දෙවියන් වහන්සේට නොකඩවා තුති පුදමු. දෙවියන් වහන්සේගේ පණිවුඩය අප ඔබ වෙත ගෙනා කල, ඔබ එය අසා පිළිගත්තේ මනුෂ්‍යයන්ගෙන් එන පණිවුඩයක් මෙන් නොව, ඇත්තෙන් ම දෙවියන් වහන්සේගෙන් ම එන පණිවුඩයක් හැටියට ය. මන්ද, අදහන ඔබ අතර ක්‍රියා කරන්නේ දෙවියන් වහන්සේ ය.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද මතෙව් 23: 9–10

ආලේලූයා! ආලේලූයා!
“මිහි පිට කිසිවකුට පියාණෝ යයි නොකියන්න.
ඔබට ඇත්තේ ස්වර්ගයෙහි වැඩවසන
එකම පියාණන් වහන්සේ ය.
ඔබේ එකම නායකයාණෝ ක්‍රිස්තුස් වහන්සේ ය.”
ආලේලූයා!

## සුවිශේෂය මතෙව් 23: 1–12

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### ඔව්හු මුවින් පවසන දේ ක්‍රියාවෙන් නොපෙන්වති.

එකල ජේසුස් වහන්සේ සමූහයාටත්, සිය ශ්‍රාවකයන්ටත් කතා කොට මෙසේ වදාළ සේක: “විනයධරයෝ ද පරිසිවරු ද මෝසෙස් ගේ ව්‍යවස්ථාවලිය පිළිබඳ බලය ලත් අටුවාචාරීහු වෙති. එබැවින් ඔවුන් ඔබට අණ කරන සියල්ල නොපිරිහෙලා පිළිපදින්න. එහෙත්, ඔවුන්ගේ ක්‍රියා අනුව නොයන්න. ඔව්හු එකක් කියති, අනිකක් කරති. ඔව්හු ඉසිලිය නොහැකි මහ බර පොදි බැඳ මිනිසුන්ගේ කරේ තබති. එහෙත්, ඒ බර පොදි ඉසිලීමට සුළැඟිල්ලක තරම වත් ආධාරයක් දීමට කැමැති

නොවෙති. ඔවුන් හැම දෙය ම කරන්නේ මිනිසුන්ට පෙනෙන පිණිස ය. ඔව්හු ශුද්ධ ලියවිලි පාඨ සඳහන් බඳන පලල් කරගෙන නළලෙහි ද බාහුවල ද පළඳිති. වස්ත්‍රවල දාවලු මහත් කරති. මංගල්‍යය භෝජනවල දී මූලාසනයට ද ධර්ම ශාලාවල දී ප්‍රධාන අසුන්වලට ද, වෙළඳපොළවල දී ගෞරවාචාර ලැබීමට ද, මිනිසුන් විසින් ‘ගුරුදේව’ කියා අමතනු ලැබීමට ද ප්‍රිය කරති. එහෙත්, ඔබ ‘ගුරුදේව’ යයි කියවා නොගන්න. ඔබගේ ගුරු දේවයාණෝ එක්කෙනෙක් ම ය. ඔබ කවුරුත් සහෝදරයෝ ය. මිහි පිට කිසිවකුට ‘පියාණෝ’ යයි නොකියන්න. ඔබට ඇත්තේ ස්වර්ගයෙහි වැඩ වසන එක ම පියාණන් වහන්සේ ය. ඔබ ‘නායකයාණෝ’ යයි කියවා නොගන්න. ඔබේ නායකයාණෝ එක්කෙනෙක් ම ය, එනම්, ක්‍රිස්තුන් වහන්සේ ය. එහෙත්, ඔබ අතරෙන් ඉතා උතුම් තැනැත්තා ඔබගේ සේවකයා වන්නේ ය. තමා ම උසස් කර ගන්නා කවරෙකු වුව ද, පහත් කරනු ලබන්නේ ය: තමා ම පහත් කර ගන්නා කවරෙකු වුව ද, ඔහු උසස් කරනු ලබන්නේ ය.”

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*